සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025(2026)

# 60 - ව්‍යපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## ලකුණු දීමේ පටිපාටිය




මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025 (2026)

## 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

I පත්‍රය - ලකුණු 1 × 40 = <u>මුළු ලකුණු 40</u>

II පත්‍රය - ප්‍රශ්න අංකය 01 අනිවාර්ය ප්‍රශ්නයකි.

ලකුණු 20 යි

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රශ්න අංක 2 | - | ලකුණු | 08 | (ඕනෑම ප්‍රශ්න 02 කට) |
| ප්‍රශ්න අංක 3 | - | ලකුණු | 08 | |
| ප්‍රශ්න අංක 4 | - | ලකුණු | 08 | ලකුණු 2 x 8 = 16 යි |

II කොටස - ගිණුම්කරණය

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රශ්න අංක 5 | - | ලකුණු | 12 | (ඕනෑම ප්‍රශ්න 2කට) |
| ප්‍රශ්න අංක 6 | - | ලකුණු | 12 | |
| ප්‍රශ්න අංක 7 | - | ලකුණු | 12 | ලකුණු 2 x 12 = 24 යි |

<u>මුළු ලකුණු 60 යි.</u>

### අවසාන ලකුණු ගණනය කිරීම

| | | |
|---|---|---|
| I පත්‍රයට මුළු ලකුණු | = | 40 |
| II පත්‍රයට මුළු ලකුණු | = | <u>60</u> |
| අවසාන ලකුණු | = | <u>100</u> |

1450



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

රහස්‍යයි
அந்தரங்கமானது

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2025(2026)
க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2025(2026)

| විෂය අංකය / பாட இலக்கம் | 60 | විෂයය / பாடம் | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරෙහි අංකය / விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 4 | 31. | 4 |
| 02. | 4 | 12. | 1 | 22. | 2 | 32. | 2 |
| 03. | 3 | 13. | 3 | 23. | 3 | 33. | 4 |
| 04. | 3 | 14. | 2 | 24. | 1 | 34. | 3 |
| 05. | 1 | 15. | 2 | 25. | 2 | 35. | 4 |
| 06. | 2 | 16. | 4 | 26. | 4 | 36. | 3 |
| 07. | 1 | 17. | 4 | 27. | 3 | 37. | 3 |
| 08. | 1 | 18. | 3 | 28. | 3 | 38. | 3 |
| 09. | 3 | 19. | 1 | 29. | 2 | 39. | 2 |
| 10. | 4 | 20. | 2 | 30. | 4 | 40. | 2 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை | 25/40 | I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25/40 |
|---|---|---|---|

## 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II පත්‍රය

1. පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ආයතනයක කාර්මික ශිල්පියකු ලෙස සේවය කළ තිළිණ පෙරේරා 2026.01.01 දින තමා සතු රු. 700 000 ක මුදල ද රු. 216 000 ක් වූ පරිගණකය හා රු. 24 000 ක ආවුද හා උපකරණ ද යොදවා 'තිළිණ ව්‍යාපාරය' නමින් තාක්ෂණික උපකරණ අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. එදින ම ඔහු **6%** ක වාර්ෂික පොලියට රු. 200 000 ක බැංකු ණයක් ලබාගත්තේ ය. වෙනත් කිසිදු ගනුදෙනුවක් එදින සිදු වූයේ නැත.

තිළිණ පෙරේරා තොරතුරු තාක්ෂණය පිළිබඳ පාඨමාලාවක් නිම කළ වරිත් හා කිසිදු පුහුණුවක් හෝ සේවා පළපුරුද්දක් නොමැති කවිඳු පිළිවෙළින් රු. 50 000 ක හා රු. 20 000 ක මාසික වැටුපකට ව්‍යාපාරයේ සේවකයින් ලෙස බඳවා ගත්තේ ය.

තිළිණ ව්‍යාපාරයේ 2026 ජනවාරි මාසයේ දි සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| තාක්ෂණික උපකරණ අලුත්වැඩියාවෙන් ලැබීම් | 600 000 |
| මාසය තුළ අලුත්වැඩියා කිරීම්වලට අදාළ වියදම් | 250 000 |
| මාසික විදුලි ගාස්තු ගෙවීම | 5 000 |
| මාසික රක්ෂණ ගාස්තු ගෙවීම | 2 000 |
| මාසික ගෙවල් කුලී ගෙවීම | 12 000 |
| සේවක වැටුප් ගෙවීම - වරිත් | 40 000 |
| - කවිඳු | 20 000 |
| 2026.01.31 දින සහන ලි බඩු වෙළෙඳසැලෙන් ලි බඩු ණයට ගැනීම | 200 000 |

තිළිණ ව්‍යාපාරය විසින් සමාජ මාධ්‍යය භාවිත කර, ව්‍යාපාරය ප්‍රචාරණය කරන අතර මාර්ගගත ක්‍රමයට (online) ඇණවුම් භාරගෙන, තම ව්‍යාපාර ස්ථානයේ දී මෙන් ම නිවෙස්වලට ද ගොස් තාක්ෂණ උපකරණ අලුත්වැඩියා කිරීම කරනු ලැබේ.

තිළිණ පෙරේරා නිතරම ව්‍යාපාරයේ සේවකයින්ගේ වැඩකටයුතු සොයා බලා ඔවුන්ට අවශ්‍ය උපදෙස් ලබාදෙයි. ඔහු සියලු ම තාක්ෂණික උපකරණ අලුත්වැඩියා කිරීම් ගුණාත්මක බවින් යුතුව, සාධාරණ මිලට නිසි වේලාවට සිදු කිරීමට අපේක්ෂා කරයි.

**අමතර තොරතුරු:**

- පරිගණකයෙහි ඵලදායී ජීව කාලය වසර 6 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.
- ආවුද හා උපකරණ වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු ය.

(i) (අ) 'තිළිණ ව්‍යාපාරය' නිෂ්පාදිතයේ ස්වභාවය අනුව අයත් වන්නේ කුමන වර්ගයේ ව්‍යාපාරයකට ද?
(ආ) තිළිණ ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කළ යුතු ද? එයට හේතුව ලියන්න.

(ii) (අ) තිළිණ ව්‍යාපාරයේ ශක්තියක් හා දුර්වලතාවක් වෙන වෙන ම ලියන්න.
(ආ) 'තිළිණ ව්‍යාපාරය' ලබාගෙන ඇති උපකාරක සේවා **දෙකක්** නම් කර, ඒවා සඳහා සිද්ධිය ඇසුරෙන් නිදසුන බැගින් ලියන්න.

(iii) (අ) 'තිළිණ ව්‍යාපාරය' හා සම්බන්ධ පහත සඳහන් එක් එක් නිෂ්පාදන සාධකය සඳහා නිදසුන බැගින් ලියන්න.
1. ශ්‍රමය
2. ප්‍රාග්ධනය

(ආ) ඉහත සිද්ධියේ ඇතුළත් පහත එක් එක් ව්‍යාපාර ක්‍රියාකාරකම අයත් වන කළමනාකරණ කාර්ය සඳහන් කරන්න.
1. ව්‍යාපාරයට වරිත් සහ කවිඳු සේවකයින් ලෙස බඳවා ගැනීම
2. තිළිණ, ව්‍යාපාර කටයුතු පිළිබඳ නිතර සොයා බැලීම

(iv) (අ) තිළිණ ව්‍යාපාරයේ අලෙවිකරණයට අයත් වන කටයුතු **දෙකක්** ලියන්න.
(ආ) සිද්ධියේ ඇතුළත් ආයෝජන මාර්ගයක් නම් කර, එයින් ලැබෙන ප්‍රතිලාභයක් සඳහන් කරන්න.

(v) තිළිණ ව්‍යාපාරයේ 2026.01.01 දිනට ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිතව ලියා දක්වන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

| |
|---|
| **(vi)** (අ) තිළිණ ව්‍යාපාරය භාවිත කළ මූලාශ්‍ර ලේඛන **දෙකක්** සඳහන් කරන්න.<br>(ආ) ඉහත (vi) (අ) හි නම් කළ එක් එක් මූලාශ්‍ර ලේඛනයට අදාළ සිද්ධියේ ඇතුළත් ගනුදෙනුව බැගින් ලියන්න.<br>**(vii)** තිළිණ ව්‍යාපාරයේ 2026.01.31 දිනට මුදල් ශේෂය ගණනය කරන්න.<br>**(viii)** තිළිණ ව්‍යාපාරයේ 2026.01.31 දිනෙන් අවසන් මාසය සඳහා පරිගණක ක්ෂය සහ ආවුද හා උපකරණ ක්ෂය වෙන වෙන ම ගණනය කරන්න.<br>**(ix)** තිළිණ ව්‍යාපාරයේ 2026.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශනයේ දැක්වෙන වියදම් වටිනාකම් සහිතව ලියන්න.<br>**(x)** තිළිණ ව්‍යාපාරයේ 2026.01.31 දිනට පහත අයිතමවල මුළු වටිනාකම සඳහන් කරන්න.<br>(අ) මුළු වත්කම්<br>(ආ) ජංගම වගකීම් **(ලකුණු 02 × 10 = 20 යි)** |

**(i)** (අ) සේවා සැපයීමේ ව්‍යාපාරයක් (ලකුණු 01 යි)

(ආ) ඔව්

ව්‍යාපාර නාමය අයිතිකරුගේ සම්පූර්ණ නමින් පවත්වාගෙන නොයන නිසා

(ලකුණු 01යි)

**(ii)**

(අ) **ශක්තීන්**

- තිළිණ පෙරේරා කාර්මික ශිල්පියෙකු ලෙස සේවය කර තිබීම
- චරිත්, තොරතුරු තාක්ෂණය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම
- අයිතිකරු සතුව මුදලක් පැවතීම
- අයිතිකරු සතුව පරිගණකය හා ආවුද උපකරණ තිබීම

(එක් කරුණකට ලකුණු ½යි)

**දුර්වලතා**

- සේවක කවිඳුට පුහුණුවක් හෝ සේවා පළපුරුද්දක් නොමැතිවීම (ලකුණු ½යි)

(ආ)

| | |
|---|---|
| • බැංකු සේවය | - රු. 200 000 ක බැංකු ණය ලබා ගැනීම |
| • රක්ෂණය සේවය | - රු. 2 000 ක රක්ෂණ ගාස්තු ගෙවීම |
| • සන්නිවේදන සේවය | - සමාජ මාධ්‍යය භාවිතයෙන් ව්‍යාපාරය ප්‍රචාරණය සිදු කිරීම |
| | - මාර්ගගත ක්‍රමයට ඇණවුම් භාර ගැනීම |

**(උපකාරක සේවාව සමග නිදසුනකට ලකුණු ½ × 2 = ලකුණු 01යි)**

**(iii)** (අ) 1. ශ්‍රමය - • චරිත්
• කවිඳු

2. ප්‍රාග්ධනය - • මුදල්
• පරිගණකය
• ආවුද හා උපකරණ
• ලී බඩු

(ලකුණු ½ × 2 = ලකුණු 01යි)

(ආ) 1. සංවිධානකරණය
2. පාලනය

(ලකුණු ½ × 2 = ලකුණු 01යි)

**(iv)**

(අ)

- තාක්ෂණික උපකරණ අළුත්වැඩියා සේවා සැපයීම
- සමාජ මාධ්‍ය භාවිතයෙන් ප්‍රචාරණයක් ලබාදීම
- මාර්ගගත ක්‍රමයට ඇණවුම් ලබාගැනීම
- ගුණාත්මයෙන් යුතු සේවා සැපයීම
- සාධාරණ මිලට සේවා සැපයීම
- නිවෙස්වලට ගොස් සේවා සැපයීම
- නිසි වේලාවට සේවාවන් ලබාදීම

*(ලකුණු ½ × 2 = ලකුණු 01යි)*

(ආ)

- ව්‍යාපාරයක් ආරම්භ කිරීම
- ලාභය

(ලකුණු ½ × 2 = ලකුණු 01යි)

**(v)**

| වත්කම් (රු.) | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| 1 140 000 | = | 940 000 | + | 200 000 |

*(ලකුණු 02යි)*

හෝ

| වත්කම් (රු.) | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| + 700 000 (මුදල්) | = | + 700 000 (ප්‍රාග්ධනය) | | |
| + 216 000 (පරිගණකය) | = | + 216 000 (ප්‍රාග්ධනය) | | |
| + 24 000 (ආම්පන්න උපකරණ) | = | + 24 000 (ප්‍රාග්ධනය) | | |
| + 200 000 (මුදල්) | = | | | + 200 000 (බැංකු ණය) |

*(නිවැරදි ගනුදෙනු දෙකක් සඳහා ½ බැගින් උපරිම ලකුණු 01යි)*

මිටින අවශ්‍ය නැත.

**(vi)**

| (අ) මූලාශ්‍ර ලේඛනය | (ආ) ගනුදෙනුව | (රු.) |
|---|---|---|
| ලදුපත | • ප්‍රාග්ධනය යෙදවීම<br>• අළුත්වැඩියා ආදායම ලැබීම<br>• බැංකු ණය ලබා ගැනීම | 700 000<br>600 000<br>200 000 |
| ගෙවීම් වවුචරය | • අළුත්වැඩියා වියදම් ගෙවීම<br>• විදුලි ගාස්තු ගෙවීම<br>• රක්ෂණ ගාස්තු ගෙවීම<br>• ගෙවල් කුලී ගෙවීම<br>• සේවක වැටුප් ගෙවීම - චරිත් කවිඳු | 250 000<br>5 000<br>2 000<br>12 000<br>40 000<br>20 000 |

60000

වරිතා කට අවශ්‍යාරියයි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

| | |
|---|---|
| ජර්නල් වවුචරය | • ලී බඩු ණයට ගැනීම 200 000<br>• පරිගණකය යෙදවීම 216 000<br>• ආවුද හා උපකරණ යෙදවීම 24 000<br>• ගෙවිය යුතු බැංකු ණය පොලිය 1 000<br>• ගෙවිය යුතු වැටුප් 10 000<br>• පරිගණක ක්ෂය 3 000<br>• ආවුද හා උපකරණ ක්ෂය 200 |
| **(ලකුණු ½ × 2 - ලකුණු 01යි)** | **(ලකුණු ½ × 2 - ලකුණු 01යි)** |

**(ලකුණු 02යි)**

**(vii)** රු. 1 171 000 **(ලකුණු 02යි)**

**හෝ**

**මුදල් පොත**

| දිනය | ල. අ. | විස්තරය | ස. පි | වට්නාකම (රු.) | දිනය | ව. අ. | විස්තරය | ස. පි | වට්නාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2026. 01.01 | | ප්‍රාග්ධනය | | 700 000 ⎤ | | | අළුත්වැඩියා කිරීමේ වියදම් | | 250 000 ⎤ |
| | | බැංකු ණය | | 200 000 ⎬ (½) | | | විදුලි ගාස්තු | | 5 000 |
| | | සේවා ආදායම් | | 600 000 ⎦ | | | රක්ෂණ ගාස්තු | | 2 000 ⎬ (01) |
| | | | | | | | ගෙවල් කුලී | | 12 000 |
| | | | | | | | වැටුප් - චරිත් | | 40 000 |
| | | | | | | | - කවිඳු | | 20 000 ⎦ |
| | | | | | 2026 01.31 | | ශේෂය ප/ගෙ/යි | | 1 171 000 |
| | | | | 1 500 000 | | | | | 1 500 000 |
| 2026. 02.01 | | ශේෂය ඉ/ගෙ | | 1 171 000 | | | | | |

ඉතිරි ½ ගාණේ ලකුණු එදිනා.

**(viii)**

• පරිගණක ක්ෂය - රු. 3 000 **(ලකුණු 01යි)**

$$\frac{2\,16\,000}{6} \times \frac{1}{12}$$ (½)

• ආවුද හා උපකරණ ක්ෂය - රු. 200 **(ලකුණු 01යි)**

$$24\,000 \times \frac{10}{100} \times \frac{1}{12}$$ (½)

**(ix)** <u>වියදම්</u> රු.

- අළුත්වැඩියා කිරීමේ වියදම් 250 000
- විදුලි ගාස්තු 5 000
- රක්ෂණ ගාස්තු 2 000
- ගෙවල් කුලී 12 000
- වැටුප් 70 000
- පරිගණක ක්ෂය 3 000
- ආවුද හා උපකරණ ක්ෂය 200
- බැංකු ණය පොලී 1 000

ලදු අගයට ලකුණු දෙන්න.

**(ඕනෑම නිවැරදි අයිතම දෙකකට ලකුණු ½ බැගින් ලකුණු 02යි)**

**(x)** (අ) • මුළු වත්කම් රු. 1 607 800 **(ලකුණු 01යි)**

| | (රු.) |
|---|---|
| පරිගණකය | 213 000 |
| ආවුද හා උපකරණ | 23 800 |
| ලී බඩු | 200 000 |
| මුදල් | 1 171 000 |

**(කරුණු 04 ට ලකුණු ½ )**

කරුණු 3 ක් හෝ 4 ක් ලදු අගය.

(ආ) • ජංගම වගකීම් රු. 11 000 **(ලකුණු 01යි)**

| | (රු.) |
|---|---|
| ගෙවිය යුතු වැටුප් | 10 000 |
| ගෙවිය යුතු බැංකු ණය පොලී | 1 000 |

**(නිවැරදි කරුණු 02 ට ලකුණු ½ )**

| | (i) | | (ii) | | (iii) | | (iv) | | (v) | (vi) | | (vii) | (viii) | (ix) | (x) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | (අ) | (ආ) | (අ) | (ආ) | (අ) | (ආ) | (අ) | (ආ) | | (අ) | (ආ) | | | | (අ) | (ආ) | 20/20 |
| | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 01 | 02 | 01 | 01 | 02 | 02 | 02 | 01 | 01 | |

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

2. (i) කේවල ස්වාමි ව්‍යාපාරයක් හා හවුල් ව්‍යාපාරයක් අතර ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) අවශ්‍යතා ඉටුකර ගන්නා විවිධ ආකාර 'වුවමනා' වේ.

(ආ) මූල්‍ය ආයතන ව්‍යාපාරවලට ඇල්මක් දක්වන්නේ දෙන ලද ණය අය කර ගැනීමට ය.

(ඉ) හවුල් ව්‍යාපාරවලට නීතිය ඉදිරියේ පුද්ගලයකු ලෙස පෙනී සිටිය හැකි ය.

(ඊ) රටක රජය විසින් ගනු ලබන යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්ති නෛතික පරිසරයට අයත් වේ. (ලකුණු 02 යි)

(iii) කොටුවැව මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් සංවිධානය කරන ලද පාසල් හැර ගිය සිසුන් සඳහා ස්වයං රැකියා මාවතකට පිවිසීමට අවශ්‍ය පුහුණු වැඩමුළුවක් වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පවත්වන ලදී.

(අ) මෙම ප්‍රකාශයේ ඇතුළත් කොටුවැව මහා විද්‍යාලයේ අභ්‍යන්තර පරිසර සාධකයක් සහ බාහිර පරිසර සාධකයක් පිළිවෙළින් ලියන්න.

(ආ) මෙම ප්‍රකාශයේ ඇතුළත් පහත සඳහන් එක් එක් රාජ්‍ය අංශයේ ආයතන අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න.

1. කොටුවැව මහා විද්‍යාලය
2. වෘත්තීය පුහුණු අධිකාරිය

(ලකුණු 02 යි)

(iv) වෙළෙඳාම සම්බන්ධ සිදුවීම් දෙකක් පහත දැක්වේ.

**A** – දසුන්, සුමති හාඩ්වෙයාර් වෙතින් තම නිවස අලුත්වැඩියාව සඳහා සිමෙන්ති කොට්ට 10 ක් මිල දී ගැනීම

**B** – ජයසිංහ වෙළෙන්දෝ විසින් 'නෙළුම් කොළේ' ආපන ශාලාවට කෑම පැකට් සකස් කර විකිණීම සඳහා රු. 15 000 ක සහල් තොගයක් විකිණීම

(අ) ඉහත සඳහන් සිදුවීම් දෙකෙහි ඇතුළත් සිල්ලර වෙළෙන්දකු හා තොග වෙළෙන්දකු පිළිවෙළින් නම් කරන්න.

(ආ) 'නෙළුම් කොළේ' ආපන ශාලාවට ඇල්මක් දක්වන පාර්ශ්ව **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

**(i)**

| කේවල ස්වාමි ව්‍යාපාර | හවුල් ව්‍යාපාර |
|---|---|
| • අයිතිය තනි පුද්ගලයෙකු සතු වේ. | • අයිතිය හවුල්කරුවන් සතු වේ. |
| • ප්‍රාග්ධනය තනි පුද්ගලයෙකු විසින් යොදනු ලැබේ. | • ප්‍රාග්ධනය හවුල්කරුවන් විසින් යොදවනු ලැබේ. |
| • අයිතිකරු ලාභාලාභ තනිව භුක්ති විඳියි. | • ලාභාලාභ හවුල්කරුවන් අතර බෙදී යයි. |
| • ස්වාධීන තීරණ ගනියි. | • සාමූහිකව තීරණ ගනියි. |
| • වගකීම් තනිවම දරා ගනියි. | • වගකීම් සාමූහිකව බෙදී යයි. |
| • මත භේද ඇති නොවේ. | • හවුල්කරුවන් අතර මත භේද ඇති විය හැකියි. |
| • අයිතිකරුගේ දක්ෂතාව පමණක් ව්‍යාපාරයට යොදයි. | • හවුල් කරුවන්ගේ විවිධ දක්ෂතා ව්‍යාපාරයට යොදා ගත හැකියි. |

**(එක් වෙනස්කමකට ලකුණු 01 බැගින් ලකුණු 02 යි)**

**(ii)** (අ) සත්‍යයි

(ආ) සත්‍යයි

(ඉ) අසත්‍යයි

(ඊ) අසත්‍යයි

**(ලකුණු $^1/_2$ x 4 = ලකුණු 02 යි)**

• ✓, × තිබුනොත් දෙන්න

**(iii)**

(අ) අභ්‍යන්තර පරිසර සාධක - කොටුවැව මහා විද්‍යාලයේ විදුහල්පති/ විදුහල්පති

බාහිර පරිසර සාධක - පාසල් හැර ගිය සිසුන්/ වෘත්තීය පුහුණු අධිකාරිය

**(ලකුණු 1/2 x 2 = ලකුණු 01 යි)**

(ආ) (1) රාජ්‍ය දෙපාර්තමේන්තුව

(2) රාජ්‍ය සංස්ථා • පිළිවෙලට ලිවීම අවශ්‍යයයි

**(ලකුණු 1/2 x 2 = ලකුණු 01 යි)**

**(iv)**

(අ)
- සිල්ලර වෙළෙන්දා - සුමති හාඩ්වෙයාර්/ නෙළුම්කොළේ ආපන ශාලාව
- තොග වෙළෙන්දා - ජයසිංහ වෙළෙන්දෝ

**(ලකුණු 1/2 x 2 = ලකුණු 01 යි)**

(ආ)
- නෙළුම් කොළේ ආපන ශාලාවේ හිමිකරු / අයිතිකරු
- ජයසිංහ වෙළෙන්දෝ / සැපයුම්කරු
- කෑම පැකට් මිලදී ගන්නන් / පාරිභෝගිකයෝ

**(ලකුණු 1/2 x 2 = ලකුණු 01 යි)**

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **2.** | **(i)** | **(ii)** | | | | **(iii)** | | **(iv)** | | **08** |
| | | (අ) | (ආ) | (ඉ) | (ඊ) | (අ) | (ආ) | (අ) | (ආ) | |
| | 02 | ½ | ½ | ½ | ½ | 01 | 01 | 01 | 01 | **08** |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**3.** (i) හර කාඩ්පතක (Debit card) සහ ණය කාඩ්පතක (Credit card) සමානකම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) දේපළ රක්ෂණයට හානිපූර්ණ මූලධර්මය අදාළ වේ.

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් චෙක්පොත් නිකුත් කරනු ලැබේ.

(ඉ) ආයතනයක් තුළ විවිධ මාධ්‍යය භාවිත කරමින් පණිවුඩ හා තොරතුරු හුවමාරු කර ගැනීම අභ්‍යන්තර සන්නිවේදනයයි.

(ඊ) ප්‍රවාහනය සඳහා භාවිත කරන මංමාවත් ප්‍රවාහන මූලිකාංගයක් වන මාධ්‍යයට අයත් වේ. (ලකුණු 02 යි)

(iii) 2026.01.30 දින අසිත දිවාකර රු. 50 000 ක බඩු තොගයක් නිමල් පෙරේරාගෙන් මිල දී ගත්තේ ය. මේ සඳහා කළමනාකරණ සහකරුවකු වූ කමල් ප්‍රනාන්දු විසින් මහරගම ලංකා බැංකු, රේඛිත චෙක්පතක් ලියා නිමල් පෙරේරාට දෙන ලදී. ඉහත තොරතුරු ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) මෙම චෙක්පතෙහි අණකරු හා ආදායකයා පිළිවෙළින් නම් කරන්න.

(ආ) මෙම චෙක්පතට බැංකු කවුන්ටරයෙන් මුදල් ලබාගත හැකි ද? ඔබේ පිළිතුරට හේතුව ලියන්න.

(ලකුණු 02 යි)

(iv) අධිවේගී මාර්ගයේ තම මෝටර් රථයෙන් ගමන් කරමින් සිටියදී කුමාර හදිසි අනතුරකට ලක් වී රු. 5 000 000 කට රක්ෂණය කර තිබූ එම මෝටර් රථයට හානි සිදු විය. මෙම අවස්ථාවේ දී කුමාරගේ මෝටර් රථය රක්ෂණය කරනු ලැබූ රක්ෂණ සමාගමේ නියෝජිතයෙක් අහඹු ලෙස එම ස්ථානයට පැමිණ, අනතුර පිළිබඳ විමසා බලා, ඒ සඳහා රු. 3 000 000 ක වන්දියක් ගෙවීමට හැකි බව දන්වා සිටියේ ය.

(අ) මෙම සිද්ධියේ ඇතුළත් ප්‍රවාහන මාධ්‍යය හා සන්නිවේදන මාධ්‍යය පිළිවෙළින් නම් කරන්න.

(ආ) රක්ෂණ සමාගම රු. 3 000 000 ක් පමණක් වන්දිය ලෙස ගෙවිය හැකි බව ප්‍රකාශ කිරීමට හේතුව හා එයට අදාළ රක්ෂණ මූලධර්මය සඳහන් කරන්න.

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

**(i)**
- කාඩ්පත් අංකයක් තිබීම
- විද්‍යුත් මුදල් ලෙස භාවිත කිරීම
- භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා භාවිත කිරීම
- ATM යන්ත්‍ර මගින් මුදල් ලබා ගැනීම
- භාවිතය පහසු වීම
- ජාත්‍යන්තර වෙළෙඳ ගනුදෙනු සඳහා භාවිත කිරීම
- [illegible] වට්ටම් ලැබීම
- විද්‍යුත් ජාල ඔස්සේ ගනුදෙනු කළ හැකි වීම (ස්වයංක්‍රීයව)
- [illegible] card
- වලංගු කාලයක් තිබීම
- Plastic card වර්ගයක් වීම
- රහස් අංකයක් තිබීම
- අනුමත ආයතන වලින් පමණක් ගනුදෙනු සිදුවීම

(ලකුණු 01 x 2 = ලකුණු 02 යි)

**(ii)** (අ) සත්‍යයි

(ආ) සත්‍යයි

(ඉ) සත්‍යයි

(ඊ) අසත්‍යයි

(ලකුණු 1/2 x 4 = ලකුණු 02 යි)

**(iii)** (අ) අණකරු - අසිත දිවාකර

ආදායකයා - නිමල් පෙරේරා

(ලකුණු 1/2 x 2 = ලකුණු 01 යි)

(ආ) නොහැකිය

රේඛිත චෙක්පතක් වීම

(ලකුණු 1/2 x 2 = ලකුණු 01 යි)

- [illegible] ලබා නැත.

**(iv)**

(අ) ප්‍රවාහන මාධ්‍යය - මෝටර් රථය

සන්නිවේදන මාධ්‍යය - වාචික (ලකුණු $^1/_2$ x 2 = ලකුණු 01 යි)

(ආ)

- හානි වූ ප්‍රමාණයට පමණක් වන්දි ගෙවන නිසා / හානියේ ප්‍රමාණය මත
- හානිපූරණ මූලධර්මය (ලකුණු $^1/_2$ x 2 = ලකුණු 01 යි)

| **3.** | **(i)** | **(ii)** | | | | **(iii)** | | **(iv)** | | **08/08** |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | **(අ)** | **(ආ)** | **(ඇ)** | **(ඈ)** | **(අ)** | **(ආ)** | **(අ)** | **(ආ)** | |
| | 02 | ½ | ½ | ½ | ½ | 01 | 01 | 01 | 01 | |

**4.** **(i)** කළමනාකරණයේ දී 'පාලනය' යනු කුමක් ද? (ලකුණු 02 යි)

**(ii)** පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

**(අ)** සෑම ආයතනයක් තුළ ම කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ.

**(ආ)** අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් ආයතනයට පාලනය කළ හැකි ය.

**(ඇ)** ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරයි.

**(ඈ)** කොළඹ කොටස් වෙළෙඳපොළේ සාමාන්‍ය කොටස් මිල දී ගැනීමට වඩා බැංකුවක ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම අවදානම් වැඩි ආයෝජන මාර්ගයකි. (ලකුණු 02 යි)

**(iii)** ලී බඩු නිෂ්පාදනය කර අලෙවි කරන ව්‍යාපාරයක කාර්ය කිහිපයක් පහත දැක්වේ.

**A** – රු. 50 000 කට වඩා එකවර ලී බඩු මිල දී ගැනීමේ දී 20% ක වට්ටමක් ලබා දීම

**B** – නවතම මෝස්තර අනුව ලී බඩු සෑදීම

**C** – ව්‍යාපාරයේ නම සඳහන් කළ පුටු 20 ක් රෝහලකට පරිත්‍යාග කිරීම

**D** – ව්‍යාපාරය ලී බඩු විකිණීම සඳහා වෙළෙඳසැල් දෙකක් පවත්වාගෙන යාම

ඉහත එක් එක් කාර්යයට අදාළ අලෙවි මිශ්‍රයේ විචල්‍යය පිළිවෙළින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

**(iv)** ස්වයං රැකියාවක නියුතු සමාධි තමාගේ රු. 500 000 ක මුදල් ආයෝජනය කර ඇත්තේ මෙසේ ය.

**A** – කොටසක් රු. 100 බැගින් සාමාන්‍ය කොටස් 2 000 ක් සීමිත අග්‍රා (පී.එල්.සී.) සමාගමෙන් මිල දී ගැනීම

**B** – වසරකින් කල්පිරෙන රු. 300 000 ක භාණ්ඩාගාර බිල්පත් මහජන බැංකුවෙන් මිල දී ගැනීම

**(අ)** ඉහත එක් එක් ආයෝජන මාර්ගයෙන් සමාධිට ලැබෙන ප්‍රතිලාභය බැගින් වෙන් වෙන්ව පිළිවෙළින් සඳහන් කරන්න.

**(ආ)** ඉහත ආයෝජන මාර්ග දෙකෙන් අවදානම අඩු ම ආයෝජන මාර්ගය නම් කර, එයට හේතුව ලියන්න.

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

**(i)** ව්‍යාපාරයේ කටයුතු සැලසුම් කළ ආකාරයෙන් ම සිදුවේ දැයි සොයා බැලීම හා එසේ නොවන්නේ නම් අඩුපාඩු හඳුනාගෙන ඒවා නිවැරදි කිරීම සම්බන්ධ ක්‍රියාවලිය පාලනය වේ.

(ලකුණු 02 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**(ii)** (අ) සත්‍යයි
(ආ) සත්‍යයි
(ඇ) අසත්‍යයි
(ඈ) අසත්‍යයි

(ලකුණු ½ x 4 = ලකුණු 02 යි)

**(iii)** A මිල/ ප්‍රවර්ධනය
B නිෂ්පාදිතය
C ප්‍රවර්ධනය
D ස්ථානය

(ලකුණු ½ x 4 = ලකුණු 02 යි)

**(iv)** (අ) A - ලාභාංශ / ප්‍රාග්ධන ලාභ
B - පොලී ආදායම්

(ලකුණු ½ x 2 = ලකුණු 01යි)

(ආ) භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම/ B
පූර්ණ රාජ්‍ය ආරක්ෂාව හිමිවීම
මුදල් කරගත හැක.

(ලකුණු ½ x 2 = ලකුණු 01 යි)

| 4. | (i) | (ii) | | | | (iii) | (iv) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | (අ) | (ආ) | (ඇ) | (ඈ) | | (අ) | (ආ) | 08/08 |
| | 02 | ½ | ½ | ½ | ½ | 02 | 01 | 01 | |

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

5. (i) ගිණුම්කරණයේ දී මූලාශ්‍ර ලේඛන භාවිත කිරීමෙන් ව්‍යාපාරයකට ලබා ගත හැකි ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) ව්‍යාපාරයක මුදල් පොතේ හර පැත්තේ සටහන් කරනු ලබන ගනුදෙනු **හතරක්** වටිනාකම් සහිතව ලියන්න. (ලකුණු 02 යි)

(iii) මාලන්ගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු දෙකක් ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පහත දැක්වේ.

| ගනුදෙනු අංක | වත්කම් | = | හිමිකම් (රු.) | + වගකීම් | |
|---|---|---|---|---|---|
| | බඩු තොග (රු.) | මුදල් (රු.) | | ණයගිමියෝ (රු.) | බැංකු ණය (රු.) |
| (1) | + 25 000 | | | + 25 000 | |
| (2) | | - 20 000 | | | - 20 000 |
| (3) | | | | | |
| (4) | | | | | |

**අවශ්‍ය වන්නේ :**

(අ) ඉහත ගනුදෙනු අංක (1) හා (2) වටිනාකම් සහිතව ලිවීම

(ආ) පහත සඳහන් ගනුදෙනු අංක (3) හා (4), මාලන්ගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය ඉහත ආකෘතියට අනුව දැක්වීම

(3) - රු. 30 000 ක භාණ්ඩ රු. 35 000 කට අත්පිට මුදලට විකිණීම

(4) - රු. 10 000 ක ව්‍යාපාරයේ රක්ෂණ ගාස්තු ගෙවීම (ලකුණු 04 යි)

(iv) ජීවන්ගේ ව්‍යාපාරයේ 2025 දෙසැම්බර් මාසය තුළ සිදු කරන ලද ගැනුම් පහත දැක්වේ.

2025.12.02 - ඉන්වොයිසි අංක 118 යටතේ නාමල්ගෙන් ගත් භාණ්ඩ රු. 75 000 කි.
2025.12.10 - ඉන්වොයිසි අංක 120 යටතේ සහන්ගෙන් ගත් භාණ්ඩ රු. 50 000 කි.
2025.12.15 - ගෙවීම් වවුචර අංක 113 යටතේ සුහද වෙළෙඳසැලෙන් අත්පිට මුදලට ගත් භාණ්ඩ රු. 60 000 කි.
2025.12.21 - ඉන්වොයිසි අංක 202 යටතේ කමල්ගෙන් ගත් භාණ්ඩ රු. 30 000 කි. වෙළඳ වට්ටම 10% කි.
2025.12.28 - ගෙවීම් වවුචර අංක 115 යටතේ සුපර් හවුස් වෙතින් මිල දී ගත් භාණ්ඩ රු. 20 000 කි.

**අවශ්‍ය වන්නේ :**

(අ) 2025 දෙසැම්බර් මාසය සඳහා ජීවන්ගේ ව්‍යාපාරයේ ගැනුම් ජ'නලය පිළියෙල කිරීම

(ආ) ජීවන්ගේ ව්‍යාපාරයේ ගැනුම් ගිණුම පිළියෙල කර, 2025.12.31 දිනට මුළු ගැනුම්වල වටිනාකම දැක්වීම (ලකුණු 04 යි)

(**මුළු ලකුණු 12 යි**)

**(i)**

- ගනුදෙනුවට අදාළ ආරම්භක ලියවිල්ල ලෙස යොදා ගත හැකිවීම.
- ගනුදෙනුව සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂියක් ලෙස භාවිත කළ හැකිවීම.
- ගනුදෙනුව පිළිබඳව අතිරේක විස්තර ලබා ගත හැකිවීම.
- ගනුදෙනුව මූලික සටහන් පොත්වල සටහන් කිරීම සඳහා භාවිත කිරීම.
- වගකිව යුතු නිලධාරියෙකු අත්සන් කර ඇති නිසා වගකීම නිශ්චිතවම පැවරිය හැකිවීම.

**(ලකුණු 01 x 2 = ලකුණු 02 යි)**



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**(ii)**

1. ප්‍රාග්ධනය යෙදවීම රු. 100 000
2. අත්පිට විකුණුම් රු. 50 000
3. ණයගැතියන්ගෙන් ලැබීම් රු. 20 000
4. බැංකු ණයක් ලබා ගැනීම රු. 50 000
5. කුලී ආදායම් ලැබීම් රු. 5 000
6. රු. 10 000 ක චෙක්පතක් ලැබීම

**(ලකුණු ½ × 4 - ලකුණු 02 යි)**

**(iii)** (අ)

01. රු. 25 000 ක බඩු තොගයක් ණයට ගැනීම.
02. බැංකු ණය රු. 20 000 ක් ගෙවීම.

**(ලකුණු 01 × 2 - ලකුණු 02 යි)**

(ආ)

| ගණුදෙනු අංකය | වත්කම් (රු.) | = | හිමිකම් (රු.) | + වගකීම් (රු.) | |
|---|---|---|---|---|---|
| | බඩු තොගය | මුදල් | | ණය හිමියෝ | බැංකු ණය |
| 3<br>4 | -30 000 | +35 000<br>-10 000 | +5 000<br>-10 000 | | |

**(ලකුණු 01 × 2 - ලකුණු 02 යි)**

**(iv)** (අ)

ගැනුම් ජර්නලය

| දිනය | ඉන්වොයිස් අංක | සැපයුම්කරු | වටිනාකම රු. | ලෙ.පි. |
|---|---|---|---|---|
| 2025.12.02 | 118 | නාමල් | 75 000 (½) | |
| 2025.12.10 | 120 | සහන් | 50 000 (½) | |
| 2025.12.21 | 202 | කමල් | 27 000 (½) | |
| 2025.12.31 | | ගැනුම් ගිණුමට හර කළා | 152 000 | |

නිවැරදි ආකෘතියට **ලකුණු** (½) **යි.**

**(ලකුණු 02 යි)**

(ආ)

ගැනුම් ගිණුම

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. | දිනය | විස්තරය | ස.පි | වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|
| 2025.12.15 | මුදල් ගිණුම | | 60 000 (½) | 2025.12.31 | ශේෂය ප/ගෙ | | 232 000 |
| 2025.12.28 | මුදල් ගිණුම | | 20 000 (½) | | | | |
| 2025.12.31 | ණය හිමි ගිණුම් | | 152 000 (½) | | | | |
| | | | 232 000 | | | | 232 000 |
| 2026.01.01 | ශේෂය ඉ/ගෙ | | 232 000 | | | | |

මුළු ගැනුම්වල වටිනාකම = රු. 232,000 (½)

**(ලකුණු 02 යි)**

| 5. | (i) | (ii) | (iii) (අ) | (iii) (ආ) | (iv) (අ) | (iv) (ආ) | |
|---|---|---|---|---|---|---|---|
| | 02 | 02 | 02 | 02 | 02 | 02 | **12/12** |

6. (i) බැංකුව චෙක්පත් අගරු කරන අවස්ථා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) සඳුන්ගේ ව්‍යාපාරයේ මාසයක් තුළ අල ටොෆි පැකට් 1000 ක් නිෂ්පාදනය කිරීමට අදාළ වියදම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| අර්තාපල් | 29 000 |
| සීනි | 6 000 |
| විදුලි වියදම් | 5 000 |
| අල ටොෆි සාදන්නාගේ වැටුප | 20 000 |
| වෙනත් වක්‍ර වියදම් | 8 500 |

**අතිරේක තොරතුරු :**

- අල ටොෆි සෑදීමේ උපකරණ පිරිවැය රු. 150 000 කි.
- අල ටොෆි සෑදීමේ උපකරණ පිරිවැය මත වාර්ෂිකව 12% බැගින් ක්ෂය කළ යුතු ය.
- ලාභාන්තිකය පිරිවැය මත 10% කි.

**අවශ්‍ය වන්නේ :**

(අ) අල ටොෆි නිෂ්පාදනයේ ප්‍රාථමික පිරිවැය

(ආ) අල ටොෆි පැකට්ටුවක විකුණුම් මිල (ලකුණු 02 යි)

(iii) ක්‍රිෂ්ණාගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම සමාන නොවූ අතර පසුව පහත සඳහන් ගිණුම්කරණ වැරදි සොයා ගන්නා ලදී.

1. අත්පිට විකුණුම් රු. 50 000 ක් විකුණුම් ගිණුමේ රු. 5 000 ක් ලෙස සටහන් වීම
2. යන්ත්‍ර අලුත්වැඩියාවට ගෙවූ රු. 10 000 ක් යන්ත්‍ර ගිණුමට හර කිරීම
3. ගෙවූ පොලී රු. 12 000 ලද පොලී ගිණුමේ බැර පැත්තේ සටහන් වීම

**අවශ්‍ය වන්නේ :**

(අ) ඉහත වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන්

(ආ) 2025.12.31 දිනට ශේෂ පිරික්සුමේ තිබූ වෙනස දක්වමින් අවිනිශ්චිත ගිණුම (ලකුණු 04 යි)

(iv) නාරදගේ ව්‍යාපාරයේ 2026 ජනවාරි මාසයේ බැංකු ගිණුම හා බැංකු ප්‍රකාශනය පහත දැක්වේ.

**බැංකු ගිණුම**

| දිනය | විස්තරය | ස.පි. | වටිනාකම (රු.) | දිනය | විස්තරය | ස.පි. | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 2026.01.01 | ශේෂය ඉ/ගෙ | | 10 000 | 2026.01.02 | විදුලිය (452200) | | 3 000 |
| 2026.01.03 | තැන්පතු-මුදල් | | 5 000 | 2026.01.04 | සමීර (452201) | | 15 000 |
| 2026.01.06 | තැන්පතු-චෙක් (204) | | 18 000 | 2026.01.08 | වැටුප් (452202) | | 8 000 |
| 2026.01.09 | තැන්පතු-චෙක් (500) | | 9 000 | 2026.01.30 | කුමාර (452203) | | 7 000 |
| | | | | 2026.01.31 | ශේෂය ප/ගෙ | | 9 000 |
| | | | 42 000 | | | | 42 000 |
| 2026.02.01 | ශේෂය ඉ/ගෙ | | 9 000 | | | | |

**2026 ජනවාරි මාසයේ බැංකු ප්‍රකාශනය**

| දිනය | විස්තරය | හර (රු.) | බැර (රු.) | ශේෂය (රු.) |
|---|---|---|---|---|
| 2026.01.01 | ශේෂය | - | - | 10 000 |
| 2026.01.03 | චෙක් - 452200 | 3 000 | - | 7 000 |
| 2026.01.03 | තැන්පතු - මුදල් | - | 5 000 | 12 000 |
| 2026.01.06 | චෙක් තැන්පතු - 204 | - | 18 000 | 30 000 |
| 2026.01.08 | චෙක් - 452202 | 8 000 | - | 22 000 |
| 2026.01.20 | චෙක්පොත් ගාස්තු | 1 000 | - | 21 000 |
| 2026.01.30 | චෙක් - 452203 | 7 000 | - | 14 000 |
| 2026.01.30 | ණයගැතියකුගේ සෘජු ප්‍රේෂණ | - | 12 000 | 26 000 |

**අවශ්‍ය වන්නේ :**

(අ) 2026.01.31 දිනට නාරදගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම

(ආ) 2026.01.31 දිනට නාරදගේ ව්‍යාපාරයේ බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**



අ.පො.ස. සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**06.**

**(i)**
- චෙක්පත් අවිධිමත්ව ලියා තිබීම
- ජංගම ගිණුමේ ප්‍රමාණවත් මුදල් නොමැති වීම
- අණකරුගේ අත්සන, ආදර්ශ අත්සනට නොගැළපීම
- චෙක්පත කල් ඉකුත්වී තිබීම
- අණකරු විසින් චෙක්පතට ගෙවීම නතර කරන ලෙස බැංකුවට දැනුම් දීම

**(ලකුණු 01 × 2 = ලකුණු 02 යි)**

**(ii)** (අ) අල ටොෆි නිෂ්පාදනයේ ප්‍රාථමික පිරිවැය

| | රු. |
|---|---|
| අල | 29 000 |
| සීනි | 6 000 |
| ටොෆි සාදන්නන්ගේ වැටුප | 20 000 |
| | 55 000 (01) |

අයිතම 3 විතරනම් ලකුණු 1 ක් දෙන්න.

(ආ) අල ටොෆි පැකට්ටුවක විකුණුම් මිල

| | රු. |
|---|---|
| ප්‍රාථමික පිරිවැය | 55 000 |
| විදුලි වියදම් | 5 000 |
| වෙනත් වක්‍ර වියදම් | 8 500 |
| උපකරණ ක්ෂය | 1 500 |
| මුළු නිෂ්පාදන පිරිවැය = | 70 000 |

| | |
|---|---|
| $\frac{70\,000}{1000}$ = රු. 70 | 70 x $\frac{10}{100}$ = රු. 07 |

ලද අගයට ½ දෙන්න.

ලද අගය වැඩි කිරීම.

රු. 70 + රු. 7

රු. 77.00 (01) **(ලකුණු 02 යි)**

**(iii)** **පොදු ජර්නලය**

| දිනය | අං. | විස්තරය | | ලෝ.පි. | හර (රු.) | බැර (රු.) |
|---|---|---|---|---|---|---|
| | | අවිනිශ්චිත ගිණුම<br>විකුණුම් ගිණුම<br>(අත්පිට විකුණුම් රු.50 000 විකුණුම් ගිණුමේ රු.5 000ක් ලෙස සටහන් වීමේ වරද නිවැරදි කිරීම) | හර | | 45 000 | 45 000 |
| | | යන්ත්‍ර අළුත්වැඩියා වියදම් ගිණුම<br>යන්ත්‍ර ගිණුම<br>(යන්ත්‍ර අළුත්වැඩියා වියදම් රු. 10 000 ක් යන්ත්‍ර ගිණුමේ හරට සටහන් වීමේ වරද නිවැරදි කිරීම) | හර | | 10 000 | 10 000 |
| | | ලද පොලී ගිණුම<br>පොලී වියදම් ගිණුම/ ගෙවූ පොලී ගිණුම<br>අවිනිශ්චිත ගිණුම<br>(ගෙවූ පොලී රු.12 000 ලද පොලී ගිණුමේ බැරට සටහන් වීමේ වරද නිවැරදි කිරීම) | හර<br>හර | | 12 000<br>12 000 | 24 000 |

**(ලකුණු 01 x 3 = ලකුණු 03 යි)**

සංලක්ෂණ ලියලා නැත්නම් ½ ක් අඩු කරන්න.

(ආ)

**අවිනිශ්චිත ගිණුම**

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම (රු.) | දිනය | විස්තරය | ස. පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| | විකුණුම් ගිණුම | | 45 000 | | ශේෂ පිරික්සුමේ වෙනස | | 21 000 |
| | | | | | ලද පොලී ගිණුම | | 12 000 |
| | | | | | පොලී වියදම් ගිණුම | | 12 000 |
| | | | 45 000 | | | | 45 000 |

(අයිතම 2 කට $^1/_2$ බැගින් ලකුණු 01 යි)

(ලකුණු 04 යි)

**(iv)** (අ)

**බැංකු ගිණුම**

| දිනය | විස්තරය | ස. පි. | වටිනාකම (රු.) | දිනය | විස්තරය | ස. පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 2026. 01.31 | ශේෂය ඉ/ගෙ | | 9 000 (½) | | චෙක්පොත් ගාස්තු | | 1 000 (½) |
| | ණයගැතියෝ | | 12 000 (½) | 2026 01.31 | ශේෂය ප/ගෙ | | 20 000 (½) |
| | | | 21 000 | | | | 21 000 |
| | ශේෂය ඉ/ගෙ | | 20 000 | | | | |

(ලකුණු 02 යි)

(ආ)

**නාරදගේ ව්‍යාපාරයේ**
**2026.01.31 දිනට බැංකු සැසඳුම් විස්තරය**

| | (රු.) |
|---|---|
| බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය | (½) 20 000 |
| එකතු කළා :- | |
| නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත (චෙක් අංකය 452201) | 15 000 (½) |
| | 35 000 |
| අඩු කළා :- | |
| තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත (චෙක් අංකය 500) | (9 000) (½) |
| 2026.01.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය | 26 000 (½) |

(ලකුණු 02 යි)

| 6. | (i) | (ii) (අ) | (ii) (ආ) | (iii) (අ) | (iii) (ආ) | (iv) (අ) | (iv) (ආ) | |
|---|---|---|---|---|---|---|---|---|
| | 02 | 01 | 01 | 03 | 01 | 02 | 02 | 12/12 |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

7. (i) 'ගෙවිය යුතු වියදම්' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ශක්ති සුහසාධක සංගමයේ භාණ්ඩාගාරික විසින් ගණනය කරන ලද 2025.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ලැබීම් හා ගෙවීම් සාරාංශය පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| සාමාජික මුදල් ලැබීම් | 52 000 |
| සඟරා මුද්‍රණය සඳහා | 18 000 |
| සඟරා විකුණුම්වලින් | 30 000 |

**අතිරේක තොරතුරු:**

- ලැබිය යුතු සාමාජික මුදල් රු. 3 000 කි.

**අවශ්‍ය වන්නේ :**

2025.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම (ආදායම් ප්‍රකාශනය) පිළියෙල කිරීම (ලකුණු 02 යි)

(iii) සුශාන්ගේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2025.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 400 000 |
| මුදල් | 20 000 | |
| 8% බැංකු ණය | | 100 000 |
| ණයගැතියෝ | 22 000 | |
| ණයහිමියෝ | | 25 000 |
| බොල් ණය | 1 200 | |
| මෝටර් රථ (පිරිවැයට) | 250 000 | |
| ඉඩම් (පිරිවැයට) | 400 000 | |
| බැංකු ණය පොලී | 3 000 | |
| පරිපාලන වැටුප් | 15 000 | |
| විදුලි ගාස්තු | 8 500 | |
| තොගය (2025.01.01 දිනට) | 4 000 | |
| ගැනුම් | 140 000 | |
| විකුණුම් | | 350 000 |
| ගෙනඒමේ කුලී | 8 000 | |
| ලද ගෙවල් කුලී | | 5 000 |
| ප්‍රචාරණ වියදම් | 4 500 | |
| වෙනත් වියදම් | 2 000 | |
| රක්ෂණ ගාස්තු | 1 800 | |
| | 880 000 | 880 000 |

**අතිරේක තොරතුරු:**

- 2025.12.31 දිනට ඉතිරි තොගය රු. 40 000 කි.
- මෝටර් රථ සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 10% බැගින් ක්ෂය කළ යුතු ය.
- 2025.12.31 දිනට ගෙවිය යුතු රක්ෂණ වාරිකය රු. 1 200 කි.

**අවශ්‍ය වන්නේ :**

(අ) 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සුශාන්ගේ ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ලකුණු 04

(ආ) 2025.12.31 දිනට සුශාන්ගේ ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ලකුණු 04

(මුළු ලකුණු 12

**07.**

**(i)** ගිණුම් කාලච්ඡේදය තුළදී ව්‍යාපාරය විසින් ලබාගෙන ඇති වර්ෂයට අදාළ සේවා වෙනුවෙන් ගිණුම් කාලච්ඡේදය අවසන් දින වන විටත් ගෙවා නොමැති වියදම්, ගෙවිය යුතු වියදම් වේ.

(ලකුණු 02 යි)

**(ii)**

ශක්ති සුහසාධක සංගමය
2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශනය

| | | |
|---|---|---|
| **ආදායම්** | | |
| සාමාජික මුදල් | 55 000 (½) | |
| සඟරා විකුණුම් | 30 000 (½) | |
| | | 85 000 |
| **වියදම්** | | |
| සඟරා මුද්‍රණය | 18 000 (½) | (18 000) |
| අතිරික්තය | | 67 000 (½) |

(ලකුණු 02 යි)

හෝ

ශක්ති සුහ සාධක සංගමය
2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් හා වියදම් ගිණුම

| | | | |
|---|---|---|---|
| සඟරා මුද්‍රණ වියදම් | 18 000 (½) | සාමාජික මුදල් | 55 000 (½) |
| අතිරික්තය | 67 000 (½) | සඟරා විකුණුම් | 30 000 (½) |
| | 85 000 | | 85 000 |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**(iii) විකල්ප පිළිතුර**

(අ)

**සුශාන් ව්‍යාපාරය**
**2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**ලාභ හෝ අලාභ ප්‍රකාශනය** (½)

| | රු. | රු. | රු. |
|---|---|---|---|
| විකුණුම් | | | 350 000 |
| අඩුකළා - විකුණුම් පිරිවැය : | | | |
| 2025.01.01 තොගය | | 4 000 | |
| එකතු කළා - ගැනුම් | 140 000 | | |
| ගෙන ඒමේ කුලී | 8 000 | 148 000 | |
| විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩ තොගයේ පිරිවැය | | 152 000 | |
| අඩුකළා - 2025.12.31 තොගය | | (40 000) (½) | |
| විකුණුම් පිරිවැය | | | (112 000) (½) |
| දළ ලාභය | | | 238 000 (½) |
| එකතු කළා - ලද ගෙවල් කුලී | | | 5 000 |
| | | | 243 000 |
| අඩු කළා වියදම් : | | | |
| **බෙදාහැරීමේ වියදම් :** | | | |
| මෝටර් රථ ක්ෂය | 25 000 (½) | | |
| බොල් ණය | 1 200 | | |
| ප්‍රචාරණ වියදම් | 4 500 | | |
| | | 30 700 | |
| **පරිපාලන වියදම්** | (½) | | |
| රක්ෂණ ගාස්තු | 3 000 | | |
| පරිපාලන වැටුප් | 15 000 | | |
| විදුලි ගාස්තු | 8 500 | | |
| | | 26 500 | |
| **මූල්‍ය හා වෙනත් වියදම්** | (½) | | |
| බැංකු ණය පොලී | 8 000 | | |
| වෙනත් වියදම් | 2 000 | | |
| | | 10 000 | (67 200) |
| ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කළා | | | 175 800 (½) |

**(ලකුණු 04 යි)**

(ආ)

**සුගාන් ව්‍යාපාරය**
**2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය** (½)

(½)

| | පිරිවැය (රු.) | සමුච්චිත ක්ෂය (රු.) | ධාරණ අගය (රු.) |
|---|---|---|---|
| ජංගම නොවන වත්කම් : | | | |
| ඉඩම් | 400 000 | - | 400 000 |
| මෝටර් රථ | 250 000 | 25 000 | 225 000 |
| | 650 000 | 25 000 | 625 000 (½) |
| ජංගම වත්කම් | | | |
| 2025.12.31 තොගය | | 40 000 (½) | |
| ණයගැතියෝ | | 22 000* | |
| මුදල් | | 20 000* | 82 000 |
| මුළු වත්කම් | | | 707 000 |
| 2025.01.01 ප්‍රාග්ධනය | | 400 000* | |
| එකතු කළා - ශුද්ධ ලාභය | | (½) 175 800 | |
| | | | 575 800 |
| ජංගම නොවන වගකීම් : | | | |
| 8% බැංකු ණය | | | 100 000* |
| ජංගම වගකීම් | | | |
| ණයහිමියෝ | | 25 000* | |
| ගෙවිය යුතු බැංකු ණය පොලී | | 5 000 (½) | |
| ගෙවිය යුතු රක්ෂණ ගාස්තු | | 1 200 (½) | |
| | | | 31 200 |
| මුළු හිමිකම් හා වගකීම් | | | 707 000 |

(*අයිතම් 4 හෝ 3 සඳහා ලකුණු (½) යි)

(ලකුණු 04 යි)

***



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න